# හෙළයේ ප්‍රථම මහ රැජිනගේ විශ්‍රාන්ති භූමිකාව

බී.එම්.ඊ.ජේ.උබේසේකර

අදින් අවුරුදු 2063කට පෙර එනම් ක්‍රිස්තු පූර්ව 47 දී ලංකාද්වීපයේ ප්‍රථම මහරැජින ලෙස අභිසෙස් ලබන අනුලා දේවිය සුවිශේෂී වූ කාන්තා චරිතයක් ලෙස ලංකා ඉතිහාසය තුළ අද්වතීය ස්ථානයක් හිමිකර ගත්තේය. අනුලා කුමරිය රැජින ලෙස කටයුතු කළ ක්‍රිස්තු පූර්ව 47 සිට ක්‍රිස්තු පූර්ව 42 දක්වා අතර කාලයේ ලංකාද්වීපයේ සහ මිසරයේ සිදුවූ සිද්ධි සමුදායක් මේ කතාවට වස්තු විෂය වන අතර මොහාන් රාජ් මඩවල විසින් පිටු 288ක් පුරාවට ඉතිහාසයට පුනර්ජීවනයක් ලබාදෙන අතරම රැජින ග්‍රන්ථය හරහා විශ්‍රාන්තිමය අත්දැකීම් සමුදායක අපව අතරමං කරන්නේය.

"මේ අතර තවත් නාවිකයන් දෙදෙනෙකු ප්‍රදර්ශන මාරාන්තික සටනක් ආරම්භකර තිබිණි. ජීවිතය බේරාගත් නාවිකයන් දෙදෙනා පැහැදිලි කළ විදිහට ඔවුන් දෙදෙනා කුඩා කාලයේ පටන්ම ප්‍රාණ සමාන මිතුරන් දෙදෙනෙකි. මේ ප්‍රාණ සමාන මිතුරන් දෙදෙනා ඒ මාරාන්තික කඩු කිණිසි හටන ආරම්භ කර ඇත්තේ ඒ වනවිට ජීවිතය පිළිබද බලාපොරොත්තු අතහැර බලාගත්තු අත බලාගෙන සිටි යාත්‍රාවේ ඉතිරිවූ නාවිකයන් හතරදෙනාට මානසික සතුටක් ලබාදීම පිණිසය. දින දෙකක් තිස්සේ අඛණ්ඩව සිදුවූ ඒ මාරාන්තික සටන නරඹා ඔවුන් මරණය පෙනි පෙනී අසාමාන්‍යය සතුටක් වින්දනය කර ඇත" "ඔහුට උවමනා වූයේ ඒ මොහොතේ විලිබියෙන් සැලෙන ඇගේ ඇස් දෙක බලා ප්‍රීතිමත් වන්නටය. එසේම මේ දැන් දියෙන් ගොඩගත් මාලූවකු පරිද්දෙන් බියෙන් සලිත වන ඇගේ සිරුර දෙස බලා සැනසෙන්නටය. එපමණකදු නොව ඇගේ ගැණු ආඩම්බරකම පරයා ඒ මොහොතේ මතුවන අහිංසක මරණ බිය දෙස බලා කොක්හඩලා සිනාසෙන්නටය." "බාග වෙලාවට ඔහු සිය රාජකීය සිරියහන් ගබඩාවේ මැදිවියේ ළදක් සමඟ තම කාම සා පිපාසා නිවා සනසා ගනිමින් ලබන ප්‍රීතියටත් වඩා ප්‍රීතියක් මේ සෙල්ලමෙන් භුක්ති වින්දේය." "ඒ නිසා තොටුපළට පැමිණි විගස ඇය මුහුද රළ පැගුවාය. වෙරළ මත දිගාවූ සුදු පෙන කැටිති අතගෑවාය." මේ ආගමික වතාවත්වලට වඩා කාගේත් අවධානය දිනාගත්තේ දෙවැනි දින රාත්‍රියේ පැවති මධුපානෝත්සවයයි. එනම් කවුරුත් නොදත් ආගන්තුක තරුණියන් පිරිසක් හදිසියේ මේ මධුපානෝත්සවයට කඩාවැදී අනපේක්ෂිතව ඉදිරිපත් කළ රංගනයයි. ඔවුහු මධුපානයෙන් සන්තර්පණය වී කදිමධීවර ගී ගැයුහ. මත්මතින් එක්වූ ධීවරයන්, වැල්ලේ කැරකි කැරකී නටන කදිම රංගනයන් ඉදිරිපත් කළහ." "අනුලා කිසිම හදිසියක් නැතිව ඇවිදගෙන ගියාය. උස කුලුනු පේළියට ඇති විවෘත ආලින්ද දිගේ ඇවිදගෙන ගොස් කෙටි පඩි පේළි නැග බැස ඇය උද්‍යානයට අවතීර්ණ වූවාය. අනුලා ඇත මැත බලා අඹ ගස් සෙවණක ඇති ගල් අසුනක් මත හිඳ ගත්තාය. එය රජවරුන්ගේ විවේකය වෙනුවෙන්ම සකස් කළ රාජකීය ශෛලමය අසුනකි." "සුමිත්ත ඇස ගසාගෙන සිටියේ මේ සැණකෙළියේ විවිධ තරග අංශවල දස්කම් දක්වන අසාමාන්‍ය මිනිසුන් කෙරෙහිය. "එබැවින් මේ සැණකෙළිය අර කාමෝත්සවයක් බවට පත්නොවී සාම්ප්‍රදායික ජන ක්‍රීඩා කෙරෙහි මූලිකත්වය දක්වන්නට ප්‍රධාන හේතු කාරණාව එය විය. එහෙත් තරමකට හෝ කාමය උද්දීපනය කරන නැටුම් ගැයුම් වැයුම් සැණකෙළියෙන් ඉවත්කිරීමට මේ කවුරුත් කල්පනා කළේ නැත." "සැණකෙළියේ පවත්වන ජනක්‍රීඩා තරග අංශ තීරණය කිරීමට කවුරුත් කැමැත්තෙන්ම සුමිත්ත වෙත භාර කළහ. ඒ අනුව කඩුශිල්ප, දුනුශිල්ප, අසුහරඹ, අංගම්පොර, මල්ලවපොර, ඇත්පොර, එළු පොර, ගොංපොර ආදී වශයෙන් වූ විවිධ තරග අංශ සැණකෙළියට අයත්විය."" අත්‍යන්ත අලංකාර නැටුම් ගැයුම් මධ්‍යයේ ආරම්භ වූ මේ සැණකෙළියෙහි මහා රැජින අනුලාගේ සිත වඩාත් ඇදබැඳ ගත්තේ දෙවන දිනයේ පැවති අංගම් පොර හා මල්ලව පොර තරඟය.වට ගණනාවක් පුරා තරගකරුවන් සියයකට අධික පිරිසක් සහභාගි වූ ඒ ජවසම්පන්න තරග සියල්ලම,ඇය විටෙක උද්යෝගය වැඩිකමට තමා හිඳ සිටි අසුනෙන් නැගිට සිටිමින් පවා නැරඹුවාය."

මේඅනුව ලංකාද්වීපයේ ප්‍රථම මහ රැජිනගේ කතාව**"රැජින"**විශ්‍රාන්තිමය අත්දැකීම් සමුදායක එකතුවකි.

මොහාන්රාජ් මඩවල(2016), රැජින, බිසෝ ප්‍රකාශන, නො.108/02, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ